**ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

---

ශීර්ෂය 202 - මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2016 ජූලි 8 දින දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 158.55 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 157.19 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 1.36 ක් හෙවත් සියයට 1 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 82.30 | 81.85 | 0.45 | 0.6 |
| මූලධන | 76.25 | 75.34 | 0.91 | 1.3 |
| **එකතුව** | **158.55** | **157.19** | **1.36** | **1.0** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 20201 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 2.86 | 1.02 | 1.20 | 1.79 | 12.00 | 5.72 |

**2.3 අග්‍රිම ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වූ ගිණුම් අංක 7002/0000/00/0135/0013/000 දරන අග්‍රිම ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 19.21 ක් විය.

**2.4 පොදු තැන්පත් ගිණුම**

දෙපාර්තමේන්තුව යටතේ වන අංක 6000/0000/00/0016/0094/000 දරන තැන්පත් ගිණුමෙහි 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 17.42 ක් විය.

**2.5 විගණන නිරීක්ෂණය**

මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | ලේඛන වර්ගය | අදාල රෙගුලාසිය |
|---|---|---|
| **(i)** | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| **(ii)** | පරිගණක, පරිගණක උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| **(iii)** | හානි පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 110 |
| **(iv)** | ලංසු කැඳවීමේ ලේඛනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 මාර්ගෝපදේශය. |

## 3.2 විසර්ජන ගිණුම

**අයවැය විචලනය**

වැය විෂයයන් 03 ක් සඳහා එකතුව රු.1,000,000 ක් වූ අධි ප්‍රතිපාදන සළසා තිබීම නිසා ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු එම වැය විෂයයන්ගේ ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 67 ක සිට සියයට 91 දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

## 3.3 අග්‍රිම ගිණුම

මුස්ලිම් සංස්කෘතික මධ්‍යස්ථානය ඉදිකිරීම වෙනුවෙන් ලබාදී තිබූ අත්තිකාරම් පියවා නොතිබීම නිසා දෙපාර්තමේන්තුවේ අංක 7002/0000/00/0135/0013/000 දරන අග්‍රිම ගිණුමේ රු.19,208,845 ක ශේෂයක් තිබුණි. ඒ අනුව රාජ්‍ය මුදල් බාහිර පාර්ශවයක් භාරයේ වසර 2 කට අධික කාලයක් රඳවා ගැනීමට ඉඩ සළසා දී තිබුණි.

## 3.4 පොදු තැන්පත් ගිණුම

වර්ෂ 2 ක් ඉක්මවූ එකතුව රු.16,001,531 ක්වූ තැන්පතු 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විගණනයට ඉදිරිපත් කළ 2015 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.314,069 ක් වූ අතර, වර්ෂ 20 කට අධික කාලයක සිට පැවත එන එම ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

**3.6 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.6.1 අභ්‍යන්තර විගණනය**

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. තැපැල්, තැපැල් සේවා හා මුස්ලිම් කටයුතු අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසින් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණනයන් සිදු කර තිබුණද දෙපාර්තමේන්තුවේ සංවර්ධන හා පරිපාලන කටයුතු, මෙහෙයවන ව්‍යාපෘති පිළිබඳ ප්‍රමාණවත් විගණනයක් ඉන් සිදු කර නොතිබුණි.

**3.7 වත්කම් කළමනාකරණය**

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

**(අ) නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

තැපැල් දෙපාර්තමේන්තුව සතු මෝටර් රථයක් 2015 ජුනි 30 දින දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණද රියදුරෙකු නොමැති වීම නිසා එම රථය 2015 දෙසැම්බර් 31 දින වන විටත් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට අඩු කාලයක සිට පැවත එන බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.681,218 ක් වී තිබුණි.

**3.8 අනුකූල නොවීම්**

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | රු. | |
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| (අ) මුදල් රෙගුලාසි 94 (1) | 336,597 | වැය විෂයයන් 6 ක් සඳහා සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය රු.336,597 කින් ඉක්මවා බැරකම්වලට එළඹ තිබුණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මුදල් රෙගුලාසි 135 | 119,141 | අවස්ථා 16 කදී එකතුව රු.119,141 ක ගෙවීම් සඳහා බලය දීම, අනුමත කිරීම හා සහතික කිරීම සිදුකර නොතිබුණි. |
| (ඇ) | මුදල් රෙගුලාසි 225 | 70,569 | අතිකාල ගෙවීමේ අවස්ථා 32 කදී ගෙවීම් වවුචර් නියමිත ආකෘති පත්‍ර වල නිවැරදි ලෙසත් සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙල කර නොතිබුණි. |
| (ඈ) | මුදල් රෙගුලාසි 237 | 67,155 | කොන්ත්‍රාන්තුව හෝ ගිවිසුම් ප්‍රකාරව සතුටුදායක ලෙස වැඩ අවසන් කර ඇති බවට සහතිකයක් වවුචරයේ ඇමිණිය යුතු වුවත් අවස්ථා 02 දී ගෙවීම් සඳහා එසේ සිදු කර නොතිබුණි. |

**3.9 කාර්යසාධනය**

-----------------

2015 වාර්ෂික අයවැය ඇස්තමේන්තුව හා ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**3.9.1 ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

-------------------------------------------------

දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණු අතර, එසේ නිරීක්ෂණය වු අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) දහම් පාසැල් ළමුන් සඳහා නිල ඇඳුම් ලබාදීම**

-------------------------------------------------

දහම් පාසැල් ළමුන්ට බෙදාදීම සඳහා මිලදීගෙන තිබු නිල ඇඳුම් කට්ටල 440 කට අදාළ රෙදි ද, එකතුව රු.641,133 ක්වු කලිසම් රෙදි 1200 ක් හා කමිස රෙදි 154 ක් ද නියමිත කාලය තුළ අදාල සිසුන් වෙත බෙදා දී නොතිබුණි.

**(ආ) මුස්ලිම් දේවස්ථාන සඳහා ආධාර ලබාදීම**

---------------------------------------------

සමාලෝචිත වර්ෂයේදි මුස්ලිම් දේවස්ථානවලට ලබාදීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 59 කට අදාලව රු.මිලියන 29 ක මුල්‍යමය ආධාර නිකුත් කර තිබුණද, එම ආධාර උපයෝජනය කිරීම පිළිබඳව දෙපාර්තමේන්තුව විසින් පසු විපරම් කටයුතු සිදුකර නොතිබුණි.

**3.10 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

---------------------------------------

නිකුත් කර තිබුණත් බැංකුව වෙත ඉදිරිපත් නොවු කල් ඉකුත් වු එකතුව රු.1,276,127 ක් වු චෙක්පත් 189 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 395 (ඇ) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් 2015 දෙසැම්බර් 31 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

**3.11 කළමණාකරණ දුර්වලතා**

භෞතික පරීක්ෂාවේදී පොත් වර්ග 28 කට අදාල එකතුව රු.174,770 ක් වටිනා පොත් 1202 ක් අඩු වී තිබුණි.

**3.12 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 09 | 04 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 04 | - | 04 |
| (iii) | ද්විතියික මට්ටම | 93 | 58 | 35 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 17 | 17 | - |
| | **එකතුව** | **123** | **79** | **44** |